කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය- තෙවන වසර 2022

**පරිපාලන නීතිය**

(පැය තුනයි.)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06

ප්‍රශ්න <u>තුනකට පමණක්</u> පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. පරිපාලන නීතියට පාදක වන මූලික මූලධර්ම වර්ධනය කර ඇත්තේ පුද්ගලයන්ගේ හරයාත්මක සහ කාර්යපටිපාටිකමය අයිතිවාසිකම් සහ බැඳියාවන් ආරක්ෂා කිරීම සඳහා පමණක් නොව නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම ද සඳහා ය. පරිපාලන ක්‍රියා විමර්ශනය කිරීම සඳහා අධිකරණය විසින් වර්ධනය කරන ලද සහ ඔප දමන ලද ඇතැම් පදනම් පාලනය කරන මූලධර්ම මේ සඳහා සාක්ෂි සපයයි. සාධාරණ පරිපාලනයේ සහ යහපාලනයේ මූලධර්ම, නෛතික පිළිගැනීම සමඟින්, පරමාධිපත්‍යය ජනතාව තුළ පවතින බවත්, පරිපාලන බලය මහජනතාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මහජන අධිකාරීන් විසින් තාවකාලිකව දරන බවත් පිළිගනී. පරිපාලනය විසින් බලය අනිසි ලෙස භාවිතා කිරීමට එරෙහිව පුද්ගලයන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා අධිකරණ විමර්ශනය නැමැති කැන්වසය පුළුල් කිරීමට මෙම සංකල්ප අධිකරණයට අවසර දෙයි.

   ඉහත ප්‍රකාශය අනුව, අදාළ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින්, අවම වශයෙන් ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රියා පිළිබඳ අධිකරණ විමර්ශනයට අදාළ මෑත කාලීන වර්ධනයන් තුනක් විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

   (ලකුණු 100)

2. Kinder Land හි පාරිසරික ආරක්ෂණ පනත මගින් පරිසරය ආරක්ෂා කිරීම, සංරක්ෂණය සහ පුනරුත්ථාපනය කිරීම; සහ දූෂණය වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා ප්‍රතිපාදන සපයයි. පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සතුය. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද ඕනෑම බලපත්‍රයක් නිකුත් කිරීමට, නියාමනය කිරීමට සහ ඇගයීමට මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයා විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව පනත මගින්

දක්වයි. පනතේ 6 වැනි වගන්තියට අනුව, අධ්‍යක්ෂවරයාගේ තීරණ අවසානාත්මක තීරණ විය යුතු අතර, කිසිදු අධිකරණයකදී ප්‍රශ්න කළ නොහැක.

මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ඉමිලි විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL) සම්බන්ධයෙන් නව මාර්ගෝපදේශ නිකුත් කර ඇත. මෙම මාර්ගෝපදේශයන්ට අනුව, බලපත්‍රයක් ලබා දීමට පෙර ව්‍යාපෘතියකින් සිදුවිය හැකි පාරිසරික බලපෑම පිළිබඳව විශේෂඥ අදහස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරයාට යුතුකමක් ඇත. බලපත්‍රලාභීන් එම අධිකාරියේ කාර්ය මණ්ඩල සුබසාධන සංවර්ධන අරමුදලට මාසිකව දායක මුදල් ගෙවිය යුතුය; විකල්ප වශයෙන් බලපත්‍රලාභියා බලපත්‍රය නිකුත් කළ දින සිට වසර පහක කාලයක් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ආයතනික සංවර්ධනය සඳහා ඔහුගේ/ඇයගේ සේවය ලබා දිය යුතුය. නව මාර්ගෝපදේශයන්ට අනුව ආදිත්‍යට EPL ලබා දී ඇත. ආදිත්‍යට බලපත්‍රය ලබාදීමේදී ඉමිලි විශේෂඥ මතය නොසලකා හැර ඇත. පසුව, ආදිත්‍ය මධ්‍යම පරිසර අධිකාරියට වැඩිදුර ගෙවීම් කිරීම හෝ කිසිදු සේවාවක් සැපයීම ප්‍රතික්ෂේප කළේය. මාස දෙකකට පසු, ඉමිලි ආදිත්‍යගේ EPL අවලංගු කළේය.

මේ අතර, ඉමිලි පනත යටතේ කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ආරම්භ කරන අතර උනන්දුවක් දක්වන පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවයි. සම්මුඛ පරීක්ෂණයකින් පසු ව්‍යාපෘතිය සඳහා පස් දෙනෙකු තෝරා ගනු ලැබේ. කමල් නැමැති එක් අයැදුම්කරුවෙකු ප්‍රතික්ෂේප විය. පසුගිය වසරේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හොඳම අපද්‍රව්‍ය කළමනාකරණ ත්‍යාගය කමල්ට ලබාදෙන ලදී. සාර්ථක අපේක්ෂකයින් පස් දෙනාට කමල්ට වඩා කසළ ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ අත්දැකීම් අඩුය. ඉමිලි සහ කමල් වෙනස් දේශපාලන පක්ෂ දෙකක සාමාජිකයෝ වෙති.

Kinder Land හි නීතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන යැයි උපකල්පනය කරන්න. බලාතික්‍රමණය යටතේ ඉමිලිගේ ක්‍රියාවන්හි නීත්‍යානුකූලභාවය සහ අධිකරණයකදී ඇයගේ ක්‍රියාවන් අභියෝගයට ලක්කිරීමේ හැකියාව සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරට සහය දැක්වීමට ඔබ අදාළ නෛතික අධිකාරීන් භාවිත කිරීමට අවශ්‍ය වේ.

(ලකුණු 100)

3. 2015 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කර ඇති අතර ගොවීන් සඳහා රසායනික පොහොර සඳහා 15% සහනාධාරයක් ලබා දෙයි. රසායනික පොහොර ආනයනයේ වෙනස්කම් සම්බන්ධයෙන් සමස්ත ලංකා ගොවි සංගමය සමඟ සාකච්ඡා කිරීමේ පරිචයක් කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව ඇත. 2021 දී අලුතින් තේරී පත් වූ රජයක් කාබනික වගා ප්‍රතිපත්තිය හඳුන්වා දුන් අතර එය රසායනික පොහොර ආනයනය තහනම්

කළේය. ඉන් අනතුරුව රජය විසින් මුහුදු පැලෑටි භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර මරියානා රාජ්‍යයෙන් ආනයනය කරන ලදී. කෙසේ වෙතත්, ජාතික ශාක නිරෝධායන සේවාව මරියානාහි සාම්පලවල හානිකර බැක්ටීරියා හඳුනාගත් අතර රජය එම තොගය ප්‍රතික්ෂේප කළේය. මේ අතර රජයට පොහොර නොමැතිකම හෙළා දකිමින් ගොවි සංගමය විරෝධතාවක් සංවිධානය කළේය. ගොවි සංගමයේ සභාපතිනිය වන ලලිතා ප්‍රකාශ කළේ නව ප්‍රතිපත්තිය අතාර්කික බවත් එය ගෘහස්ථ කෘෂි නිෂ්පාදන අඩුවීමට හේතු වූ බවත්ය. ඔවුන්ගේ ගැටළු ලිඛිතව ඉදිරිපත් කිරීමට ඔවුන් දැරූ ප්‍රයත්නයන් අසාර්ථක විය. ඔවුන් මාස අටක් අඛණ්ඩව විරෝධතාවයේ නිරතවීමෙන් පසු නව ප්‍රතිපත්තිය පිළිබඳව වන ගොවීන්ගේ ගැටළු සම්බන්ධයෙන් විද්වත් කමිටු මණ්ඩලයක් පිහිටුවා වාර්තාවක් ලබාදෙන ලෙස රජය කෘෂිකර්ම අමාත්‍යවරයාට උපදෙස් ලබාදුන්නේය. 2022 ජනවාරි 13 වැනි දින විද්වත් කමිටුව හමුවේ ඇයගේ ගැටළු ඉදිරිපත් කරන ලෙස ලලිතාගෙන් පමණක් ඉල්ලා සිටිමින්, 2022 ජනවාරි 12 වැනි දින, ඇයට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලිපියක් ලැබුණි. විද්වත් කමිටු මණ්ඩලයේ අමරනාත් සිටින බව ලලිතා දුටුවාය. අමරනාත් කාබනික ගොවිතැන ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කරයි. ලලිතාට ඇයගේ ගැටළු කමිටුව හමුවේ ඉදිරිපත් කිරීමට සීමිත කාලයක් ලබා දී තිබූ අතර, ලලිතා විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් පළාත් මට්ටමේ වෘත්තීය සමිතිවල ලිඛිත ගැටළු සලකා බැලීම කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ප්‍රමාණවත් හේතු දැක්වීමකින් තොරව ලලිතා කළ ඇතැම් ඉල්ලීම් කමිටුව ප්‍රතික්ෂේප කළේය.

පරිපාලන නීතියට අදාළ සංකල්ප, මූලධර්ම සහ නඩු තීන්දු නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සිදුවීම් විශ්ලේෂණය කරන්න. අදාළ අධිකාරීන්ගේ තීරණවලට අභියෝග කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලයේ විෂය පථය ගැන දැනගැනීමට ලලිතා කැමැත්තෙන් පසුවෙයි. ලලිතාට උපදෙස් දෙන්න.

(ලකුණු 100)

4. ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ධීවර පනත යටතේ නම්කරන ලද ජල මාර්ග තුළ මසුන් ඇල්ලීම සඳහා දේශීය බෝට්ටු හිමිකරුවන්ට බලපත්‍ර ලබා දෙයි. ශීලා සහ මහේෂ් මීගමුවේ ජල මාර්ග තුළ මසුන් ඇල්ලීම සඳහා බලපත්‍රයක් ඉල්ලා සිටියහ. ඔවුන්ගේ යාත්‍රාවල තත්ත්වය පරීක්ෂා කර තමාට වාර්තා කරන ලෙස අධ්‍යක්ෂවරයා සහකාර අධ්‍යක්ෂවරයාට නියෝග කළේය. ශීලාගේ බෝට්ටුවේ ගබඩා පෙට්ටිවලට හානි සිදු වී තිබුණි. කෙසේ වෙතත්, ශීලා සමඟ ඔහුගේ පවුල් සබඳතා හේතුවෙන් ශීලාගේ බෝට්ටුව හොඳ තත්ත්වයේ පවතින බව සහකාර අධ්‍යක්ෂවරයා වාර්තා කළේය. මේ අතර මහේෂ්ගේ බෝට්ටුව පරීක්ෂා නොකර ඔහුගේ බෝට්ටුව මීගමුව ජල මාර්ගයේ යාත්‍රා කිරීමට තරම් හොඳ තත්ත්වයේ නැති බව සහකාර අධ්‍යක්ෂවරයා වාර්තා කළේය. මීට පෙර

අවස්ථාවකදී සහකාර අධ්‍යක්ෂවරයා බීමත්ව සිටි බවත්, මහේෂ්ගේ මෝටර් රථයේ වැදුණු බවත් ඔහු සමඟ උණුසුම් වචන හුවමාරුවක් සිදු වූ බවත් මහේෂ් අධ්‍යක්ෂවරයාට දන්වා සිටියේය. අධ්‍යක්ෂවරයා එම සිද්ධිය නොසලකා හැර මහේෂ්ට බලපත්‍රයක් ලබාදීම ප්‍රතික්ෂේප කළේය. මේ අතර දේශීය ධීවර යාත්‍රාවල පෙනුම සහ තත්ත්වය සංචාරක අමාත්‍යාංශය අනුමත නොකළහොත් බලපත්‍රයක් ලබා නොදීම ධීවර දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිය බව අධ්‍යක්ෂවරයා ශීලාට දන්වා සිටියේය. සතියකට පසු, සංචාරක අමාත්‍යවරයා විදේශ භාෂාවලින් සංචාරකයන් සමඟ සන්නිවේදනය කිරීමේ හැකියාවට යටත්ව ශීලාගේ බලපත්‍රය අනුමත කරන ලෙස අධ්‍යක්ෂවරයාට නියෝග කළේය. මේ අතර සංචාරක අමාත්‍යවරයා තම අමාත්‍යාංශයේ සේවය කරන අනූෂාට බලපත්‍රයක් ලබාදීමට වැඩිදුරටත් නිර්දේශ කළේය. දේශීය ධීවර ප්‍රජාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් තම බලතල ක්‍රියාත්මක කිරීම අදාළ අධිකාරීන්ගේ යුතුකම බව ශීලා සහ මහේෂ් විශ්වාස කරති. ශීලා සහ මහේෂ් ධීවර සංගමයේ සභාපතිගෙන් උපදෙස් පතයි.

අදාළ පාර්ශ්වයන් විසින් ගනු ලබන තීරණ සහ ක්‍රියාමාර්ගවල නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් සංගමයේ සභාපතිවරයා ඔබේ උපදෙස් පතයි. අදාළ පරිපාලන නීති මූලධර්ම සහ නඩු තීන්දු නීතිය වෙත යොමු කිරීමෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න. නෛතික ස්ථිතියද ඇතුළුව සංගමයේ සභාපතිවරයාට උපදෙස් දෙන්න.

(ලකුණු 100)

5. අධිකරණ සමාලෝචනයේ පදනමක් ලෙස සමානුපාතිකත්වය මතුවීමත් සමඟ අතාර්කිකත්වය සහ වෙඩ්න්ස්බරි අසාධාරණභාවය යෙදීමට අදාළ ප්‍රවණතා වෙනස් වී ඇත. අද වන විට මෙම හේතු අතර එකතුවක් පවතින අතර පරිපාලන ක්‍රියාමාර්ග විමර්ශනය කිරීමේදී ඒවා අධිකරණය ඒවා ප්‍රගතිශීලිව යොදා ගෙන ඇත.

ඔබ එකඟ වන්නේද? ඔබගේ තර්ක සනාථ කිරීම සඳහා එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ නඩු නීතිය ඇසුරින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 100)

6. Yuto හි පාරිභෝගික කටයුතු අධිකාරිය (CAA) 2003 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සඳහා ස්ථාපිත කර ඇත. පනතේ 3 වැනි වගන්තිය මගින් අසාධාරණ වෙළෙඳ පරිචයන් සහ නිෂ්පාදන ආශ්‍රිත අනතුරුවලට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලතල ලබාදී ඇත. මූල්‍ය අර්බුදකාරී කාලපරිච්ඡේදයක අසාධාරණ මිල ඉහළ යෑම් පාලනය කිරීම, නිෂ්පාදන තත්ත්ව පරිහානිය සහ නිෂ්පාදන ආශ්‍රිත අනතුරු සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සඳහා විශේෂ ගැසට් පත්‍ර නිකුත් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යුතුකම බව පනතේ

වැඩිදුරටත් සඳහන් වේ. මේ වන විට Yuto රාජ්‍ය මුදල් අවභාවිතය සහ දූෂණය හේතුවෙන් දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස LP ගෑස් හිඟයක් සහ ශීඝ්‍ර මිල ඉහල යාමක් සිදු විය. 'LP Gas' අත්‍යාවශ්‍ය භාණ්ඩයක් ලෙස සඳහන් කරමින් එහි මිල වැඩි කිරීම CAA අනුමැතියට යටත්ව සිදුකෙරෙන විශේෂ ගැසට් නිවේදනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලදී. Lanka Gas Distribution Company (LGDC) යනු යූටෝ හි 2007 සමාගම් පනත යටතේ නිසි ලෙස සංස්ථාපිත සමාගමකි. LGDC වෙත පැවරී ඇත්තේ රට තුළ LP ගෑස් එලදායී කළමනාකරණය සහ බෙදා හැරීමයි. මෙම කාර්යය Yuto හි අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා දෙපාර්තමේන්තුව විසින් එයට පවරා ඇත. කෙසේ වෙතත්, පසුගිය මාස තුන තුළ, LGDC මගින් CAA හි පූර්ව අනුමැතිය ලබා නොගෙන අඛණ්ඩව මිල වැඩි කර ඇත. විවිධ ස්ථානවල ගෑස් සිල්ලර මිල ගණන් පිළිබඳ විෂමතාවයන් සම්බන්ධයෙන් තනි පුද්ගල පැමිණිලි දහස් ගණනක් CAA වෙත ලැබී ඇත. මීට අමතරව, හදිසි ගෑස් පිපිරීම් පිළිබඳව CAA වෙත බොහෝ පැමිණිලි ලැබී ඇත. එවැනි ගෑස් පිපිරීම් හේතුවෙන් මරණ කිහිපයක් සිදු විය. Yuto හි පාරිභෝගිකයන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කරන රාජ්‍ය නොවන සංවිධානයක් වන පාරිභෝගික අයිතිවාසිකම් සුරකීමේ සංගමය (CRPS) චෝදනා කරන්නේ පසුගිය මාස 6 තුළ මෙම පැමිණිලි කිසිවක් විමර්ශනය කර නොමැති බවයි. පරීක්ෂණ පැවැත්වීම සඳහා විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රතික්ෂේප කළේය. ඔහු කියා සිටියේ නළ, රෙගියුලේටර වැනි ප්‍රමිතියෙන් තොර උපාංග භාවිත කිරීම හේතුවෙන් මෙම අනතුරු සිදුව ඇති බවයි. මිල ඉහළ යෑම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා තමාගේ බලය දැනටමත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා ඇති බවද ඔහු වැඩිදුරටත් සඳහන් කරයි. කෙසේ වෙතත්, Yuto හි තත්ත්ව සහතික කිරීමේ ආයතනයක් වන Intertek විසින් සිදු කරන ලද පරීක්ෂණයකින් LP වායුවේ සංයුතියේ වෙනසක් හේතුවෙන් පිපිරීම් සිදුවී ඇති බව වාර්තා කර ඇත. CAA හි අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ LGDC ට එරෙහිව නඩුවක් ගොනු කිරීමට CRPS ට අවශ්‍යව ඇත.

Yuto හි නීතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන යැයි උපකල්පනය කරන්න. CAA සහ LGDC මගින් සිදු වූ අසාධාරණයට එරෙහිව සාර්ථක ප්‍රතිකර්මයක් ලබා ගැනීමට CRPS ඔබේ උපදෙස් පතයි. CRPS ට උපදෙස් දෙන්න.

(ලකුණු 100)